සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

21 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු

கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்

General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019

13 ශ්‍රේණිය **Grade 13**	**ආර්ථික විද්‍යාව - I** **Economics - I**	**පැය දෙකයි** **Two hours**

සැලකිය යුතුයි :

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 50 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**
- **සෑම ප්‍රශ්නයකටම ලකුණු 02 බැගින් හිමිවේ.**

(01) ආර්ථික නොවන සම්පත් වල පවතින සුවිශේෂී ලක්ෂණයක් හඳුනාගන්න.

1. සෑම විටම අසීමිතව ලබාගත හැකිවීම
2. මිලක් ගෙවීමකින් තොරව ලබාගත හැකිවීම
3. සැපයුමක් පවතින විට පිරිවැයකින් තොරව ලබාගත හැකිවීම
4. ආර්ථික භාණ්ඩ බවට පත් කළ නොහැකිවීම
5. උපයෝගීතාවයක් නොමැතිවීම (...............)

(02) පහත සඳහන් දෑ අතුරින් සමාජ ප්‍රාග්ධනයට අයත් වන්නේ, මොනවාද?

1. පාසල් හා රෝහල් ගොඩනැගිලි
2. වරාය හා ගුවන් තොටුපල පහසුකම්
3. අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා.
4. අර්ධ නිමි ද්‍රව්‍ය හා නිමි භාණ්ඩ
5. ගොවි සංවිධාන හා ක්‍රීඩා සමාජ (...............)

(03) අර්ථිකයක පවතින සම්පත් සම්භාරය පූර්ණ හා උපරිම කාර්යක්ෂමතාවයෙන් නිෂ්පාදනයට යෙදවූ විට,

1. එක් භාණ්ඩයක නිමැවුම වැඩිකිරීමට තවත් භාණ්ඩයක නිමැවුම අඩුකළ යුතු වේ.
2. ආවස්ථික පිරිවැයකින් තොරව නිමැවුම වැඩිකළ හැකි වේ.
3. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයට පිටතින් පිහිටි භාණ්ඩ සංයෝගයක් පරිභෝජනය කළ හැකිවේ.
4. නිමැවුම වැඩිකරන විට උද්ධමනීය පරතරයක් බිහිවේ.
5. විභව නිමැවුමට වඩා සත්‍ය නිමැවුම අඩුවේ. (...............)

(04) සමාජ සාධාරණත්වය ඇති කිරීමට රජය ක්‍රියාකාරී ලෙස මැදිහත් වන ආර්ථික හඳුන්වන්නේ,

1. ධනවාදී ආර්ථික පද්ධති ලෙසය
2. සමාජයීය වෙළඳපොළ ආර්ථික ලෙසය
3. සමාජවාදී වෙළඳපොල ආර්ථික ලෙසය
4. මිශ්‍ර ආර්ථික පද්ධති ලෙසය
5. සැලසුම් ආර්ථික පද්ධති ලෙසය. (...............)

(05) ගෑස්මිල පහල බැසීම ගෑස් වෙළඳපොල තුළ කවර බලපෑමක් ඇති කරනු ලැබේද?

1. ඉල්ලුමෙහි වැඩි වීමක්
2. සැපයුම් කරනු ලබන ප්‍රමාණයේ වැඩිවීමක්
3. ඉල්ලුමෙහි අඩුවීමක්
4. සැපයුමෙහි අඩුවීමක්
5. ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ වැඩිවීමක් (...............)

(06)



Y නැමැති භාණ්ඩයේ වෙළඳපොල ඉල්ලුම ඉහත රූප සටහනෙහි දක්වේ. A ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍යය දක්වා ගමන් කිරීමට හේතු වන සාධකයක් වන්නේ,

1. x නැමති ආදේශක භාණ්ඩයේ මිල ඉහළ යාම
2. පාරිභෝගික රුචිය ඉහළ යාම
3. පාරිභෝගික රුචිය පහළ යාම
4. පාරිභෝගික ආදායම පහළ යාම
5. Y භාණ්ඩයේ නිෂ්පාදන පිරිවැය අඩුවීම (...............)

(07) පුද්ගලයෙකුගේ ආදායම රුපියල් 10,000 සිට රුපියල් 20,000 දක්වා වැඩිවන විට ඔහු පරිභෝජනය කළ භාණ්ඩයක් සඳහා වූ ඉල්ලුම ඒකක 60 සිට 50 දක්වා අඩු කරයි. එම තොරතුරු අනුව එම භාණ්ඩය,

1. අනුපූරක භාණ්ඩයකි.
2. බාල භාණ්ඩයකි.
3. නීච භාණ්ඩයකි.
4. අත්‍යාවශ්‍ය භාණ්ඩයකි.
5. සුඛෝපභෝගී භාණ්ඩයකි. (...............)

(08)



ඉහත රූප සටහනට අනුව M ලක්ෂයේ සැපයුම් නම්‍යතාවය වන්නේ,

1. 0.22 2. 1.22 3. 0.66 4. 0.55 5. 0.33 (..............)

(09) එක්තරා භාණ්ඩයක් සම්බන්ධව ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ

Qd = 20-2p (ඉල්ලුම් සමීකරණය)

Qs = -30 + 3p (සැපයුම් සමීකරණය)

එම භාණ්ඩයට අදාල අධි ඉල්ලුම් සමීකරණය වනුයේ,

1. 30 + 5p 2. 50 - 5p 3. 50 + 5p 4. 20 + 2p 5. 20 - 4p

(..............)

(10) වෙළඳපොල සමතුලිතය සම්බන්ධයෙන් අදාල නොවන කොන්දේසියක් වන්නේ,

1. අපේක්ෂිත ඉල්ලුම හා අපේක්ෂිත සැපයුම සමාන විය යුතුයි.
2. අධි ඉල්ලුම හා අධි සැපයුම ශූන්‍ය විය යුතුයි.
3. පාරිභෝගික පැහැදම හා ව්‍යාපාර අයහාරය සමාන විය යුතුයි.
4. අධි ඉල්ලුම හා අධි සැපයුම සමාන විය යුතුයි.
5. අධි ඉල්ලුම් මිල හා අධි සැපයුම් මිල ශූන්‍ය වේ. (..............)

(11)



ඉහත ප්‍රස්තාර සටහනට අනුව සැපයුම් රේඛාව S_0 - S_1 දක්වා දකුණට විතැන්වීම නිසා,

1. සමතුලිත මිල හා ප්‍රමාණය දෙකම වැඩිවේ.
2. සමතුලිත මිල අඩුවී ප්‍රමාණය වැඩිවේ.
3. සමතුලිත මිල වැඩිවී ප්‍රමාණය අඩු වේ.
4. සමතුලිත මිල හා ප්‍රමාණය දෙකම අඩුවේ.
5. සමතුලිත මිල අඩුවී ප්‍රමාණය අඩු වේ. (..............)

(12) ආණ්ඩුව විසින් විශේෂිත සහනාධාරයක් නිෂ්පාදනයට ලබාදෙනු ඇතැයි සලකන්න. එහිදී අලෙවියෙහි විශාල වැඩිවීමක් සිදුවිය හැකි අවස්ථාව වනුයේ,

1. සැපයුම් මිල නම්‍යතාවය එකට වැඩි අගයක් සහ ඉල්ලුමේ මිල නම්‍යතාවය එකට වැඩි අගයක් ගැනීම
2. ඉල්ලුමේ සහ සැපයුමේ මිල නම්‍යතාවය එකට වඩා අඩු අගයක් ගැනීම
3. සැපයුමේ මිල නම්‍යතාවය එකට වඩා වැඩි අගයක් ගැනීම සහ ඉල්ලුමේ මිල නම්‍යතාවය එකට වඩා අඩු අගයක් ගැනීම
4. සැපයුමේ මිල නම්‍යතාවය එකට වඩා අඩු අගයක් ගැනීම සහ ඉල්ලුමේ මිල නම්‍යතාවය එකට වඩා වැඩි අගයක් ගැනීම
5. ඉල්ලුමත් සැපයුමත් මිල නම්‍යතාවයත් ශුන්‍ය අගයක් ගැනීම (...............)

(13) ළදරු කිරිපිටි පරිභෝජනය කරන දරුවන් වෙනුවෙන් වැය කිරීමට සිදුවන පිරිවැය අඩු කිරීම අරමුණු කොටගෙන රජය විසින් සෑම දෙමව්පියෙකුටම එක් එක් දරුවා වෙනුවෙන් සහනාධාර කුපන්පතක් දෙනු ලැබේ යැයි සලකන්න. මේ නිසා ළදරු කිරිපිටි වෙළඳපොලෙහි කෙබඳු වෙනසක් ඇතිවිය හැකි ද?

1. ළදරු කිරිපිටි සැපයුමේ හිඟයක් දිගින් දිගටම හට ගනු ඇත.
2. ළදරු කිරිපිටි සැපයුම අඩුවන අතර මිල ඉහළ යනු ඇත.
3. ළදරු කිරිපිටි ඉල්ලුම වැඩිවන අතර මිල ඉහළ නගිනු ඇත.
4. ළදරු කිරිපිටි සැපයුම වැඩිවන අතර මිල පහළ බසිනු ඇත.
5. ළදරු කිරිපිටි සඳහා ඉල්ලුම අඩුවන අතර මිල පහළ බසිනු ඇත. (...............)

(14) තරඟකාරී වෙළෙඳපොළක අලෙවි වන භාණ්ඩයක් පිළිබඳ තොරතුරු පහත සඳහන් ඉල්ලුම් සැපයුම් සමීකරණ වලින් ඉදිරිපත් වේ.

Qd = 1300 - 10p   Qs = 100 + 10p

මෙම භාණ්ඩය අලෙවියේදී රජය සෑම ඒකකයක් මතම රුපියල් 20/= ක බද්දක් නිෂ්පාදකයින් මත පනවනු ඇත. බද්දෙන් පසු වෙළඳපොළ නව සමතුලිත මිල සහ රජයේ බදු අයභාරය කොපමණ ද?

	සමතුලිත මිල	රජයේ බදු අයභාරය (රුපියල්)
1	50	25,000
2	55	10,000
3	60	10,000
4	70	12,000
5	70	42,000

(...............)

(15) ව්‍යාපාර ආයතනයක කෙටිකාලය හා සම්බන්ධ පහත ප්‍රකාශ අතුරෙන් සාවද්‍ය ප්‍රකාශය වනුයේ කුමක් ද?

1. මුළු ඵලදාව උපරිම වන විට ආන්තික ඵලදාව ශුන්‍ය වෙයි.
2. මුළු ඵලදාව අඩුවන විට ආන්තික ඵලදාව ඍණ වෙයි.
3. නිමැවුම ක්‍රමයෙන් වැඩිවන විට සාමාන්‍ය ස්ථාවර පිරිවැය අඩුවෙයි.
4. ආන්තික ඵලදාව උපරිම වනවිට ආන්තික පිරිවැය අවම වෙයි.
5. තාර්කික නිෂ්පාදන ආයතනයක් විචල්‍ය සාධක යෙදවුම් ප්‍රමාණය නිගමනය කරනු ලබන්නේ ආන්තික ඵලදාවක් ලැබීමට පටන්ගන්නා අවස්ථාවේ දීය. (...............)

(16)



නිමැවුම ඒකක 25ක් නිපදවනු ලබන තරඟකාරී නිෂ්පාදන ආනයන පිරිවැය වක්‍ර ඉහත රූප සටහනෙහි පෙන්නුම් කෙරේ. ඒකක 25 ක් නිපදවීමේ දී ආයතනයේ මුළු විචල්‍ය පිරිවැය හා මුළු පිරිවැය කොපමණද?

	මුළු විචල්‍ය පිරිවැය	මුළු පිරිවැය
1	රු. 250	රු. 300
2	රු. 250	රු. 375
3	රු. 375	රු. 500
4	රු. 425	රු. 550
5	රු. 500	රු. 625

(...............)

(17) පූර්ණ තරඟකාරී ආයතනයක කෙටි කාලීන සැපයුම් වක්‍රය ව්‍යුත්පන්න වනුයේ,

1. ආයතනයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයේ අවම ලක්ෂයට ඉහළින් පිහිටි ආන්තික පිරිවැය වක්‍රයෙනි.
2. ආයතනයේ මුළු පිරිවැය වක්‍රයේ ධන බෑවුම සහිත කොටසිනි.
3. ආයතනයේ සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ ධන බෑවුම සහිත කොටසිනි.
4. ආයතනයේ ආන්තික පිරිවැය වුනයේ ඍණ බෑවුම සහිත කොටසිනි.
5. ආයතනයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයේ ධන බෑවුම සහිත කොටසිනි. (...............)

(18) ආර්ථික බදු කුලියට සහ සංක්‍රාම ඉපයුම් වලට අදාළ පහත ප්‍රකාශ වලින් වැරදි ප්‍රකාශය කුමක් ද?

1. යම් සාධකයක් පවත්නා සේවා නියුක්තියේ රඳවා ගැනීමට අපේක්ෂා කරන අවම මිල එම සාධකයේ සංක්‍රාම ඉපයුම වන අතර එය ඉක්මවා ලැබෙන ආදායම ආර්ථික බදු කුලිය වෙයි.
2. යම් සාධකයක සැපයුම පූර්ණ අනම්‍ය නම් ආර්ථික බදු කුලියක් නොමැති අතර මුළු ඉපයීම සංක්‍රාම ඉපයීම වෙයි.
3. සාධකයේ සැපයුම සාපේක්ෂ වශයෙන් අනම්‍ය නම් ආර්ථික බදුකුලියට දායකත්වය ඉහළ යයි.
4. සාධකයේ සැපයුම ඒකීය නම්‍ය නම් ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපයීම සමාන වෙයි.
5. සාධකයේ සැපයුම ක්‍රමයෙන් නම්‍ය නම් ආර්ථික බදුකුලිය හීනවෙයි. (...............)

(19) පහත ප්‍රකාශ අතුරින් සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?

1. ආර්ථික පසුබැසීම යනු ආර්ථිකයක කෙටිකාලීන තත්ත්වයකි.
2. ආර්ථිකයක පොදුමිල මට්ටමෙහි අඛණ්ඩ ඉහළයාම උද්ධමනයකි.
3. ව්‍යාපාර චක්‍රයක විභව නිමැවුම් රේඛාවෙන් පෙන්නුම් කරනුයේ දිගුකාලීන ආර්ථික වෘද්ධියේ හැසිරීමකි.
4. රාජ්‍ය ආදායම හා රාජ්‍ය වියදම වෙනස් කිරීම මඟින් සාර්ව ආර්ථික විචල්‍යයන්ට බලපෑම් කිරීම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියකි.
5. ව්‍යාපාර චක්‍රයක මුදුනක සිට පතුල දක්වා ගමන් කරන අවධිය නිමැවුමේ ප්‍රසාරණ අවධියකි.

(...............)

(20) නිෂ්පාදිතයේ එකතුකල වටිනාකම ගණනය කිරීමට අදාල දත්ත සමහරක් මතු දැක්වේ. (රුපියල් මිලියන)

නිමැවුමේ වටිනාකම (වෙළඳ පොළට ප්‍රවේශ වීමට පෙර)	10,000
ප්‍රාග්ධන ක්ෂය වීම්	1,200
අමුද්‍රව්‍ය මිලට ගැනුම්	3,500
බදුකුලී	2,000
සේවා සඳහා ගෙවීම්	2,000

නිෂ්පාදන මූලාශ්‍ර අනුව නිෂ්පාදිතයේ දළ එකතු කළ වටිනාකම වන්නේ රුපියල් මිලියන

1. 4500කි. 2. 6500කි. 3. 8800කි. 4. 9200කි. 5. 11200කි.

(...............)

(21) එක්තරා වසරක ජාතික ගිණුම්කරණයට අදාළ දත්ත සමහරක් මතු දැක්වේ. (රුපියල් මිලියන)

දළ දේශීය වියදම	1300
භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන	500
දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය	800
භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන	300

ඉහත දත්ත අනුව දේශීය ඉතුරුම් සහ සම්පත් සම්භාරයේ වටිනාකම පිළිවෙලින් රුපියල් මිලියන

1. 200 ක් හා 1500 ක් වේ.
2. 500 සහ 1500 ක් වේ.
3. 800 ක් හා 1800 ක් වේ.
4. 100 ක් හා 1000 ක් වේ.
5. 1000 ක් හා 1800 ක් වේ.

(...............)

(22) එක්තරා ආර්ථිකයක ආයෝජන වියදම රුපියල් බිලියන 100 කින් ඉහළ යන විට සමතුලිත ජාතික ආදායම රුපියල් මිලියන 400 කින් ඉහළ ගියේ නම් එම ආර්ථිකයේ ආන්තික පරිභෝජන නැම්යාව (MPC) විය යුත්තේ,

1. 0.2කි 2. 0.25කි. 3. 0.5කි. 4. 0.75කි. 5. 4.0කි.

(...............)

(23) රජයේ කටයුතු නොමැති ආවෘත ආර්ථිකයක සමාහාර ඉතුරුම් ශ්‍රිතය $S = -200 + 0.2y$ බවත්, සමතුලිත ජාතික ආදායම් මට්ටම රුපියල් බිලියන 4000 ක් බවත් සලකන්න. මෙම ආර්ථිකයේ අයෝජන මට්ටම කොපමණ ද?

1. රු.බි. 3000කි.
2. රු.බි. 1600කි
3. රු.බි. 1000කි.
4. රු.බි. 800කි.
5. රු.බි. 600කි.

(...............)

(24) අනෙකුත් කරුණු නොවෙනස්ව පවතින විටක, සමාහාර ඉල්ලුමෙහි වැඩිවීමක් ඇති කිරීමෙහිලා පහත සඳහන් කවර කරුණක් ඉවහල් වේද?

1. ආදායම් මත පනවන බදු ඉහළයාම
2. පොලී අනුපාතිකය ඉහළයාම
3. ඉතුරුම් ඉහළ යාම
4. ආණ්ඩුවේ වියදම් ඉහළ යාම
5. ආනයන ඉහළ යාම (...............)

(25) ආර්ථිකයන්හි ශ්‍රම විභාජනය හා විශේෂීකරණය පුළුල් වීමට බලපෑ ප්‍රධානතම සාධකය වන්නේ,

1. මුදල් පූර්ණ ද්‍රවශීල වත්කමක් ලෙස ක්‍රියා කිරීමයි
2. මුදල් විනිමය මාධ්‍යයක් ලෙස භාවිතා කිරීමයි.
3. මුදලේ අගය ස්ථාවරව පැවතීමයි.
4. මුදලේ වටිනාකම් මිණුම් දණ්ඩක් ලෙස ක්‍රියකිරීමයි.
5. මුදල් විලම්භිත ගෙවුම් මාධ්‍යයක් ලෙස ක්‍රියාකිරීමයි. (...............)

(26) ණයපත් මුදල් ආදේශක ලෙස සැලකෙන්නේ ඒවා,

1. වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියාකරන බැවිනි.
2. පහසුවෙන් හුවමාරු මාධ්‍යයක් බවට පෙරළාගත හැකි බැවිනි.
3. තාවකාලික හුවමාරු මාධ්‍යක් ලෙස ක්‍රියාකරන බැවිනි.
4. පූර්ණ ද්‍රවශීලතාවයෙන් යුක්ත බැවිනි.
5. නීත්‍යානුකූල වලංගුභාවයක් පවතින බැවිනි. (...............)

(27) රටක මූල්‍ය සමස්තයන්ට අදාල දත්ත සමහරක් දැක්වේ. (රුපියල් බිලියන)

මහජනයා වෙතැති ව්‍යවහාර මුදල්	600
වාණිජ බැංකු වෙතැති ව්‍යවහාර මුදල්	100
මහ බැංකුවේ වෙතැති වාණිජ බැංකු තැන්පතු	300
විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු	1000
වාණිජ බැංකු වෙතැති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු	1400

මෙම ආර්ථිකයේ අධි බලැති මුදල් රුපියල් බිලියන 100කින් ඉහළ ගියහොත් පටුමුදල් සැපයුම රුපියල් බිලියන

1. 100කින් ඉහළ යනු ඇත.
2. 160කින් ඉහළ යනු ඇත.
3. 200 කින් ඉහළ යනු ඇත.
4. 260කින් ඉහළ යනු ඇත.
5. 300කින් ඉහළ යනු ඇත. (...............)

(28) කේන්සියානු විග්‍රහයට අනුව මුදලට ඇති ඉල්ලුම වැඩිවිය හැකකේ පහත සඳහන් කවර තත්ත්වයක් යටතේද?

	මූර්ත ආදායම	මිල මට්ටම	පොලී අනුපාතිකය
1	අඩුවීම	ස්ථාවරව තිබීම	වැඩිවීම
2	වැඩිවීම	අඩුවීම	වැඩිවීම
3	ස්ථාවරව තිබීම	අඩුවීම	අඩුවීම
4	අඩුවීම	ස්ථාවරව තිබීම	වැඩිවීම
5	වැඩිවීම	වැඩිවීම	අඩුවීම

(29) දිගු කලක් තිස්සේ මධ්‍යස්ත හා තරමක් අනවරත වේගයකින් සිදුවන උද්ධමනය හඳුන්වන්නේ,

1. මතුපිට සිදුවන උද්ධමනය ලෙසයි.
2. ජවන උද්ධමනය ලෙසයි.
3. මූලික උද්ධමනය ලෙසයි.
4. ප්‍රසර්පන උද්ධමනය ලෙසයි.
5. නිරුද්ධමනය ලෙසයි. (..............)

(30) උද්මනයක් වාසිදායක වන්නේ,

1. ණය ගැතියන්ටය
2. ණය හිමියන්ටය
3. ඉතිරි කරන්නන්ටය
4. විශ්‍රාමිකයන්ටය
5. රජ්‍ය සේවකයන්ටය. (..............)

(31) කිසියම් රටක නාමික දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 100 ක් සහ සංසරණ ප්‍රවේගය 2.5ක් වේ. යැයි උපකල්පනය කලහොත් මුදල් සැපයුම,

1. රුපියල් බිලියන 10 කි.
2. රුපියල් බිලියන 20 කි.
3. රුපියල් බිලියන 30 කි.
4. රුපියල් බිලියන 40 කි.
5. රුපියල් බිලියන 50 කි. (..............)

(32)

	රු.බි.
පුළුල් මුදල් සැපයුම (M2)	500
අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු (50%)	300
විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල නේවාසික තැන්පතු	200
මහජනයා වෙතැති කාසි හා නෝට්ටු	120
වාණිජ බැංකු සංචිත	80
වාණිජ බැංකු මහ බැංකුවේ පවත්වාගෙන යන තැන්පතු	20

ඉහත දත්ත උපයෝගී කරගනිමින් ආර්ථිකයේ මුදල් ගුණකය (M2b) පුළුල් මුදල් සැපයුම අනුව කොපමණද?

1. 5කි. 2. 3කි. 3. 2.5කි. 4. 2කි 15කි. (..............)

(33) වාණිජ බැංකු පද්ධතියකට අදාල කල්පිත ශේෂ පත්‍රයක තොරතුරු පහතින් දක්වේ.

ඉල්ලුම් තැන්පතු	රු.මි. 800
සංචිත	රු.මි. 240
අධි සංචිත	රු.මි. 80
මහජනයා සතු ව්‍යවහාර මුදල්	රු.මි. 1000

අධි සංචිත සම්පූර්ණයෙන්ම ණය දීම සඳහා යොදවයි නම් අවසානයේ පටු මුදල් සැපයුම කොපමණද?

1. රුපියල් මිලියන 1600
2. රුපියල් මිලියන 1880
3. රුපියල් මිලියන 1400
4. රුපියල් මිලියන 2200
5. රුපියල් මිලියන 5000 (...............)

(34) මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් අලෙවි කළ විට

1. සංචිත මුදල් හෙවත් අධි බලැති මුදල් වැඩිවේ.
2. සංචිත මුදල් හෙවත් අධි බලැති මුදල් අඩුවේ.
3. ඉල්ලුම් තැන්පතු වැඩිවේ.
4. පොලී අනුපාතිකය පහළ යයි.
5. මුදල් සැපයුම වැඩිවේ. (...............)

(35) වාණිජ බැංකු ශේෂ පත්‍රයක ප්‍රාථමික සංචිත වලට අයත් නොවන්නේ කුමක් ද?

1. අතැති මුදල්
2. බැංකුවෙන් අයවිය යුතු ශේෂ
3. ආයෝජන සුරැකුම්
4. දේශීය බැංකු වලින් අයවිය යුතු මුදල්
5. අතැති හා පිටරට බැංකු වලින් අයවිය යුතු මුදල් (...............)

The National e-Learning Portal for The General Education

(36) සාර්ව ආර්ථික ස්ථායිතාව බිඳවැටී අවපාතයක් බිහිවන විට දැකිය හැකි ලක්ෂණ හඳුනාගන්න.

	නිමැවුම	සේවා නියුක්තිය	සමහාර ඉල්ලුම	මිල මට්ටම
1	වැඩිවේ.	වැඩිවේ.	අඩුවේ.	අඩුවේ.
2	අඩුවේ.	අඩුවේ.	අඩුවේ.	අඩුවේ.
3	වැඩිවේ.	වැඩිවේ.	වැඩිවේ.	වැඩිවේ.
4	අඩුවේ.	වැඩිවේ.	වැඩිවේ.	අඩුවේ.
5	වෙනස් නොවේ.	අඩුවේ.	වැඩිවේ.	වැඩිවේ.

(...............)

(37) පහත සඳහන් ලක්ෂණ අතුරින් අර්ධ පොදු භාණ්ඩයක ලක්ෂයක් වන්නේ,

1. ධාරිතා මට්ටම තෙක් පරිභෝජනය තරඟකාරී නොවන ආන්තික පිරිවැය ඉක්මවූ මිලක් නියම විය හැකි භාණ්ඩයකි.
2. පරිභෝජනය තරඟකාරී වන ආන්තික පිරිවැයට වඩා අඩු මිලක් නියම විය හැකි භාණ්ඩයකි.
3. පරිභෝජනය තරඟකාරී නොවන පරිභෝජනය සීමා කළ හැකි භාණ්ඩයකි.
4. පරිභෝජනය තරඟකාරී නොවන පරිභෝජනය සීමා කළ නොහැකි භාණ්ඩයකි.
5. රජය විසින් සහන මිලට සපයන භාණ්ඩයකි. (...............)

(38) පහත සඳහන් ක්‍රියාමාර්ග අතුරින් පරිභෝජනයේ ධන බාහිරතා බිහිකිරීමට හේතුවන ක්‍රියාමාර්ගය කුමක් ද?

1. බීමතින් රියපදවන රියදුරන්ගෙන් දඩ මුදලක් අයකිරීම
2. පාසල් ළමුන් සඳහා සහන මිලට වාර ප්‍රවේශ පත්‍ර ලබාදීම
3. ඖෂධ මිල ගණන් පහත හෙලීම
4. ග්‍රාමීය කර්මාන්තකරුවන්ට අවශ්‍ය ප්‍රාග්ධනය දීමනා ලෙස ලබාදීම
5. අපද්‍රව්‍ය පරිසරයට මුදා හරින නිෂ්පාදකයින්ට විරුද්ධව නඩු පැවරීම (...............)

(39) ප්‍රතික්‍රමික ස්වරූපයෙන් බදු අයකිරීමේදී ඇතිවන දුර්වලතාවයක් වන්නේ,

1. සිරස් සාධාරණත්ව මූලධර්මයට පටහැනි වීම
2. බදු බරින් වැඩි ප්‍රමාණය නිෂ්පාදකායට දැරීමට සිදුවීම
3. බදු බරින් වැඩි ප්‍රමාණය පාරිභෝගිකයාට දැරීමට සිදුවීම
4. බදු ආදායම අඩුවීමට හේතුවීම
5. බද්ද නිසා භාණ්ඩ වල මිල ගණන් සීඝ්‍රයෙන් වැඩිවීම (...............)

(40) ''අධි බදු බර'' යන්නෙන් අදහස් කරන්නේ,

1. බද්ද නිසා පාරිභෝගික හා නිෂ්පාදන පාර්ශව දරන මූල්‍ය බදු බරයි.
2. බද්ද නිසා පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්ත වලින් අහිමිවන ප්‍රමාණයයි.
3. පාරිභෝගිකයාට දැරීමට සිදුවන බදු බරයි.
4. නිෂ්පාදකයාට දැරීමට සිදුවන බදු බරයි.
5. බද්ද පැනවීම බදු පදනමට ඇති කෙරෙන බලපෑමයි. (...............)

(41) රාජ්‍ය වියදම් පිළිබඳ ආර්ථික වර්ගීකරණය අනුව වර්තන වියදම් නිවැරදිව දැක්වෙන්නේ,

1. මූර්ත වත්කම් අත්කර ගැනීම, ප්‍රාග්ධන පැවරුම්, ඌන වියදම් සඳහා වෙන් කිරීම්
2. ප්‍රාග්ධන පැවරුම්, භාණ්ඩ හා සේවා වියදම්, වර්තන පැවරුම්
3. භාණ්ඩ හා සේවා වියදම්, පොලී ගෙවීම්, වර්තන පැවරුම් හා සහනාධාර (සංක්‍රාම)
4. වර්තන පැවරුම්, පොලී ගෙවීම්, මූර්ත වත්කම් අත්පත් කරගැනීම්
5. ප්‍රාග්ධන පැවරුම්, ඌන වියදම්, වර්තන පැවරුම් (...............)

(42) රාජ්‍ය වියදම් තුළ අන්තර්ගත ප්‍රාග්ධන වියදමක් නොවන්නේ,

1. ගොඩනැගිලි ඉදිකිරීම්
2. ප්‍රවාහන වියදම්
3. යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම්
4. රථ වාහන මිලදී ගැනීම්
5. මහාමාර්ග ඉදිකිරීම් (...............)

(43) රජයේ ශුද්ධ මූල්‍ය හිඟය හා සමස්ත අයවැය ශේෂය අතර වෙනස වන්නේ,

1. රජයේ මුළු වියදම් වේ.
2. පුනරාවර්තන වියදම් වේ.
3. සමස්ත ගිණුමේ ශේෂය වේ.
4. ණය වාරික ආපසු ගෙවීම් වේ.
5. ප්‍රදාන ලැබීම් වේ. (...............)

(44) සැපයුම් පාර්ශවයේ ආර්ථික ප්‍රතිපත්ති වල උපකරණයක් නොවන්නේ,

1. පෞද්ගලීකරණයයි
2. බදු ප්‍රතිසංස්කරණයයි
3. ඉතිරි කිරීම් වැඩි දියුණු කිරීමයි
4. නියාමනකරණයයි
5. ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණයයි (...............)

(45) උග්‍ර පසු බෑමකට මුහුණ පා සිටින ආර්ථිකයක, නිෂ්පාදනය උත්තේජනය කිරීමෙහි ලා උචිත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් වනුයේ,

1. ආණ්ඩුවේ වියදම් අඩු කිරීම
2. ආණ්ඩුවේ වියදම් වැඩි කිරීම
3. පෞද්ගලික ආදායම් බදු ඉහළ නැංවීම
4. මහ බැංකුවේ විවෘත වෙළඳපොළ සුරැකුම්පත් අලෙවි කිරීම
5. මහ බැංකුවේ විවෘත වෙළඳපොළ සුරැකුම්පත් මිලදී ගැනීම (...............)

(46) ශ්‍රී ලංකාව සහ ඉන්දියාව සහල් සහ තේ නිෂ්පාදනය සිදුකරයි. එක් එක් භාණ්ඩය නිපදවීම සඳහා ඒ ඒ රටට අවශ්‍ය ශ්‍රම ප්‍රමාණය පහත වගුවේ දක්වේ.

රට	සහල්	තේ
ශ්‍රී ලංකාව	6	8
ඉන්දියාව	2	4

ඉහත දත්ත සැලකිල්ලට ගත්විට වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,

1. තේ නිෂ්පාදනයේ නිරපේක්ෂ වාසිය ශ්‍රී ලංකාවට ඇත.
2. සහල් නිෂ්පාදනයේ නිරපේක්ෂ වාසිය ශ්‍රී ලංකාවට ඇත.
3. සහල් නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය ශ්‍රී ලංකාවට ඇත.
4. සහල් නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය ඉන්දියාවට ඇත.
5. තේ නිෂ්පාදනයේ සාපේක්ෂ වාසි ඉන්දියාවට ඇත. (...............)

(47) නිර්බාධ වෙළඳපොල තත්ත්වයක් යටතේ දේශීයව නිපදවන සහ ආනයනය කරන ලද සිමෙන්ති කොට්ටයක මිල රුපියල් 1000 ක් වේ. දේශීය සිමෙන්ත් නිෂ්පාදනයේදී 60% ආනයනික යෙදවුම් භාවිතා කරයි. දේශීය සිමෙන්ති කර්මාන්තය ආරක්ෂා කිරීමට ආනයනික සිමෙන්ති මත රජය 20% ක ආනයන තීරු බද්දක් පනවයි නම් සඵල ආරක්ෂණ අනුපාතය වනුයේ,

1. 100% 2. 50% 3. 40% 4. 20% 5. 10% (...............)

(48) පසුගිය දිනවල ඇමරිකන් ඩොලර් ඒකකයේ ශ්‍රී ලංකා රුපියල් මිල සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් වන්නේ,

1. ශ්‍රී ලාංකික පාරිභෝගිකයින්ට ඇමරිකාවේ භාණ්ඩ සාපේක්ෂ ලෙස ලාභදායී වේ.
2. ඇමරිකන් පාරිභෝගිකයින්ට ශ්‍රී ලංකාවේ භාණ්ඩ සාපේක්ෂ ලෙස මිල අධික වේ.
3. ශ්‍රී ලංකා සංචාරකයින් වැඩි වැඩියෙන් ඇමරිකාවට යාම ශක්තිමත් කෙරේ.
4. ඇමරිකාව තුළ ශ්‍රී ලංකාවේ රුපියල් සඳහා පවතින ඉල්ලුම අඩුවේ.
5. ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයන්ට ඇමරිකාවේ භාණ්ඩ සාපේක්ෂව මිල අධික වේ. (...............)

(49) එක්තරා රටක අපනයන මිල දර්ශකය 150% කින් ඉහළ ගිය අතර ආනයන මිල දර්ශකය 100% කින් වැඩි වේ. ඇත්නම් එම රටේ වෙළෙඳ අනුපාතය

1. 66.66 වේ. 2. 80 වේ. 3. 120 වේ. 4. 125 වේ. 5. 150 වේ.

(...............)

(50) පහත ගනුදෙනු අතුරින් ගෙවුම් ශේෂ ලේඛනයේ භාණ්ඩ හා සේවා ගිණුමේ සේවා අපනයන, ආනයන වලට ඇතුළත් නොවන විදේශ ගනුදෙනුව කුමක්ද?

1. රක්‍ෂණ සේවා අපනයන ආනයන ගනුදෙනු
2. මූල්‍ය නොවන අස්පෘශ්‍ය වත්කම් සඳහා විදේශ ගෙවීම්
3. ප්‍රවාහන සේවා අපනයන ආනයන ගනුදෙනු
4. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂ ගැනුම් හිමිකම් (SDR)
5. පරිගණක හා සන්නිවේදන සේවා අපනයන ආනයන ගනුදෙනු (...............)

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

21	S	II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்
General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019

13 ශ්‍රේණිය Grade 13	ආර්ථික විද්‍යාව - II Economics - II	පැය තුනයි Three hours

සැලකිය යුතුයි :
- **'අ' කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද 'ආ' කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද, තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **අමතර කියවීම් කාලය විනාඩි 10**

අමතර කියවීම් කාලය විනාඩි 10

"අ" කොටස

(01) i. අ) නිෂ්පාදන සාධකයක් ලෙස ප්‍රාග්ධනය යන්න හඳුන්වන්න. (ලකුණු 02)

ආ) ප්‍රාග්ධනය වෙනත් නිෂ්පාදන සාධක වලින් වෙන්කර හඳුනාගත හැකි සුවිශේෂ ලක්ෂණ කවරේද?

ii. අ) ''ආදායම් ව්‍යාප්තිය'' පිළිබඳ ගැටලුව හඳුන්වන්න. (ලකුණු 02)

ආ) මෙම ගැටලුව විසඳා ගැනීමේදී වෙළෙඳපොළ ආර්ථික පද්ධතිය සහ සැලසුම් ආර්ථික පද්ධති එකිනෙකින් වෙනස් වන ආකාරය පහදන්න. (ලකුණු 02)

iii. සිරස් අක්ෂයේ එළවළු සහ තිරස් අක්ෂයේ ඇඟළුම් යන භාණ්ඩ දෙක දක්වෙන වැඩිවන ආවස්ථික පිරිවැය සහිත නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර යොදා ගනිමින් පහත සිදුවීම් නිරූපණය කර පැහැදිලි කරන්න. (ලකුණු 02)

අ) දේශපාලන අස්ථාවරභාවය නිසා විදේශිකයයන් ඇඟළුම් කර්මාන්තයේ ආයෝජන ඉවත් කර ගැනීම

ආ) ආනයනික යෙදවුම් මිල ගණන් ඉහළයාම නිසා ඇඟළුම් නිෂ්පාදනය අඩුවීම

ඉ) එළවළු නිෂ්පාදනය සඳහා යෙදවුම් අවශ්‍යතාව පෙරට වඩා අඩුවීම

ඊ) රජයේ නව සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් ශ්‍රම සේවා වියුක්තිය පහත වැටීම

උ) රැකියා වෙළඳපොළ සම්බන්ධ ගැටළු හේතුවෙන් ශ්‍රමිකයන්ගේ බාහිර ශුද්ධ සංක්‍රමණය ඉහළ යාම

(ලකුණු 5 × 2 = 10)

iv. ''ආර්ථික කාර්යක්ෂමතාවය'' නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත ඕනෑම ලක්ෂයකින් පෙන්නුම් කළහැක. ඉහත ප්‍රකාශයට එකඟවිය හැකි ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 02)

(02) i. මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකයේ වටිනාකම අනුව මිල ඉල්ලුම් නම්‍යතා ප්‍රභේද දක්වන්න. (ලකුණු 04)

ii. වෙළෙඳපොළ ''සැපයුම'' තීරණය කරන සාධක කවරේද? (ලකුණු 04)

iii. ''පාරිභෝගික අතිරික්තය'' හා නිෂ්පාදන අතිරික්තය'' අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. පොල් සඳහා වන තරඟකාරී වෙළෙඳපොලකට අදාල ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත දැක්වේ.

Qd = 24-4p (ඉල්ලුම් සමීකරණය)

Qs = 4p (සැපයුම් සමීකරණය)

අ) ඉහත සමීකරණ වලට අදාල අධි ඉල්ලුම් සමීකරණය හා අධි සැපයුම් සමීකරණය සොයන්න. (ලකුණු 02)

ආ) අධි ඉල්ලුම් හා අධි සැපයුම් සමීකරණ ඇසුරෙන් සමතුලිත මිල සොයන්න. (ලකුණු 02)

v. පහත වගුවේ හිස්තැන් සම්පූර්ණ කිරීමට ගැලපෙන වචනය යොදන්න.

	මිල ඉල්ලුම් ගම්‍යතාව	මිල වෙනස්වීම	පාරිභෝගික පැහැදම
අ)	- 0.3	වැඩිවේ	....
ආ)	- 1.2	....	අඩුවේ
ඉ)	- 0.5	....	අඩුවේ
ඊ)	- 1.0	වැඩිවේ	....

(03) i. තරඟකාරී වෙළෙඳපොළක අලෙවි වන x භාණ්ඩයේ ප්‍රමාණය ඒකක 80 දී සැපයුම් මිල රුපියල් 16 කි. ප්‍රමාණය 80 දී රුපියල් 48 ක අධි ඉල්ලුම් මිලක් පවතී. භාණ්ඩයේ සැපයුම් නම්‍යතාවය ධන 1කි. මිල රුපියල් 48 දී ඉල්ලුම් ප්‍රමාණය 160ක් වේ. භාණ්ඩයේ ඉල්ලුම් සැපයුම් වක්‍ර සරල රේඛීය වේ.

අ) ඉහත දත්ත උපයෝගීකරගෙන ඉල්ලුම් සැපයුම් වක්‍ර නිර්මාණය කර සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය දක්වන්න. (ලකුණු 04)

ආ) සෑම භාණ්ඩ ඒකකයක් සඳහාම රුපියල් 8/= නිෂ්පාදන සහනාධාරයක් රජය ලබාදුනහොත් සහනාධාරයෙන් පසු නව සැපයුම් වක්‍රය රූප සටහනෙහි නිර්මාණය කර සහනාධාරයෙන් පසු ගැනුම්කරුගේ මිල සහ සැපයුම්කරුගේ මිල ඉදිරිපත් කරන්න. (ලකුණු 04)

ඉ) නිෂ්පාදන සහනාධාරයෙන් පාරිභෝගිකයාට හා නිෂ්පාදකයාට ලැබෙන වාසිය ගණනය කර දක්වන්න. (ලකුණු 02)

ii. නිදහස් තරඟකාරී වෙළෙඳපොළක අලෙවි වන එක් භාණ්ඩයක් පිළිබඳ තොරතුරු පහත ඉල්ලුම් සැපයුම් සමීකරණය මගින් ඉදිරිපත් වේ.

Qd = 30 - 2P

Qs = -2 + 2P

අ) නිෂ්පාදකයින් නඟාසිටුවීම සඳහා භාණ්ඩයේ සහතික මිල රුපියල් 10/= ලෙස ලබාදීමට රජය තීරණය කරයි. සහතික මිලට ප්‍රතිචාර දක්වමින් නිෂ්පාදකයෝ උපරිම ප්‍රමාණය වෙළෙඳපොළට සපයන්නේ නම් එම ප්‍රමාණය කොපමණද? (ලකුණු 02)

ආ) සහතික මිල ක්‍රමය යටතේ උපරිම ප්‍රමාණය වෙළෙඳපොළට සපයන්නේ නම් වෙළෙඳපොළෙහි ක්‍රියාත්මක වන මිල කොපමණ ද? (ලකුණු 02)

ඉ) මිල ආධාරක ප්‍රතිපත්තියක් ලෙස ඌන පූර්ණ ගෙවීම් ප්‍රතිපත්තිය අනුගමනය කරන්නේ නම් ඒ සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය කොපමණද? (ලකුණු 02)

iiii. නිදහස් තරඟකාරී වෙළෙඳපොළක අලෙවි වන පාරිභෝගික භාණ්ඩයක මිල ඉල්ලුම් සැපයුම් බලවේග මත තීරණය වේ. රජය විසින් එම භාණ්ඩය මත පාරිභෝගික වැට් බද්දක් පනවනු ඇත. බද්දෙන් පසු තත්ත්වය රූප සටහනකින් ඉදිරිපත් කරන්න. ගැනුම්කරුගේ මිල, සැපයුම්කරුගේ මිල, බද්දේ ප්‍රමාණය රූප සටහන උපයෝගී කරගෙන ඉදිරිපත් කරන්න. (ලකුණු 04)

(04) i. අ) ව්‍යාපාර ආයතනයක ගණකාධිකාරී ලාභ ආර්ථික ලාභ වලට වඩා වැඩි වේ. පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ) හීනවන ඵල නීතිය අර්ථ දක්වන්න. එම නීතිය පදනම් කරගනු ලබන උපකල්පන කවරේද? (ලකුණු 03)

ii. පූර්ණ තරග ව්‍යාපාර ආයතනයක භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වන්නේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 03)

iii. පූර්ණ තරග ව්‍යාපාර ආයතනයක් කෙටිකාලයේදී ආන්තික අයභාරය, ආන්තික පිරිවැයට සමාන වන එක් අවස්ථාවකදී අතිප්‍රාමාණික ලාභ (ආර්ථික ලාභ) ලබන ආකාරය රූප සටහන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. අ) ඒකාධිකාරී තරග වෙළෙඳපොලෙහි මූලික ලක්ෂණ දක්වන්න. (ලකුණු 02)

ආ) ස්වභාවික ඒකාධිකාරය යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02)

ඉ) පූර්ණ තරග ආයතනයක ආර්ථික ලාභ ශූන්‍ය මට්ටමක පැවතියත් නිෂ්පාදන ආයතන අඛණ්ඩව නිෂ්පාදනයෙහි යෙදී සිටීම ආයතනයකට සතුටුවිය හැකි තත්ත්වයකි. එකඟ වන්නේ ද? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04)

(05) i. දළ දේශීය නිෂ්පාදිතය හා දළ ජාතික ආදායම අතර ඇති වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii. දෙන ලද වර්ෂයක එක්තරා ආර්ථිකයක ජාතික ගිණුම් ආශ්‍රිත දත්ත සමූහයක් පහත දැක්වේ. (වටිනාකම රුපියල් මිලියන)

සේවක ආදායම්	14000
දළ මෙහෙයුම් අතිරික්තය	9000
ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය	1000
මිශ්‍ර ආදායම්	800
නිෂ්පාදන මත අයකල වෙනත් බදු	700
ශුද්ධ විදේශ වර්තන සංක්‍රාම	2500
ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම	1100
නිෂ්පාදනය මත ලබාදුන් වෙනත් සහනාධාර	200
භාණ්ඩ හා සේවා මත බදු - සහනාධාර	5900

පහත දේ ගණනය කරන්න.

අ) දළ දේශීය නිෂ්පාදිතය

ආ) දළ ජාතික ආදායම

ඉ) වැයකළ හැකි දළ ජාතික ආදායම (ලකුණු 06)

iii. ''හරිත ජාතික ගිණුම්කරණය තිරසර සංවර්ධනය හා බැඳුනු සංකල්පයකි'' ඒ අනුව හරිත දළ ජතික දේශීය නිෂ්පාදිතය ගණනය කරනු ලබන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

iv. සමාහාර වියදම යනු කුමක් ද? ඊට ඇතුළත් සංරචක කවරේද? (ලකුණු 02)

v. කල්පිත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය C = 600 + 0.8 yd වන අතර එම ආර්ථිකයට අදාල පහත තොරතුරු ඔබට දී ඇත. (රුපියල් මිලියන)

ස්වාධීන බදු	(T)	250
ශුද්ධ අපනයන	(Nx)	- 100
ආයෝජන	(I)	200
රාජ්‍ය වියදම	(G)	300
අපනයන	(x)	200

අ) කාන්දුවීම් = විදීම් (W = J) ප්‍රවේශයට අනුව අදාල ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම ගණනය කරන්න. (ලකුණු 04)

ආ) මෙම ආර්ථිකයේ බදු අයකිරීම් රුපියල් මිලියන 300 දක්වා ඉහළ නංවනු ලැබුවහොත් සමතුලිත ජාතික ආදායමට වන බලපෑම ගුණිත සංකල්පය යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

''ආ'' කොටස

(06) i. ව්‍යවහාර මුදල්, බැංකු මුදල් සහ විද්‍යුත් මුදල් අතර වෙනස සැකෙවින් දක්වන්න. (ලකුණු 06)

ii. මුදලේ අගය යනු කුමක් ද? එය රටක මිල මට්ටම හා සම්බන්ධ වන්නේ කෙසේ ද? (ලකුණු 02)

iii. උද්ධමනය යනු කුමක් ද? ආර්ථික න්‍යායාට අනුව උද්ධමනයට බලපාන ප්‍රධාන හේතු ඔබ විග්‍රහ කරන්නේ කෙසේ ද? (ලකුණු 04)

iv. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටමේ වෙනස්කම් සඳහා පාරිභෝගික මිල දර්ශකය හැරුණු විට වර්තමානයේ භාවිතා කෙරෙන ප්‍රධාන මිල දර්ශක දෙක නම් කරන්න. ඒවා පිළිබඳ කෙටි පැහැදිලි හැඳින්වීමක් කරන්න. (ලකුණු 04)

v. සාමපේක්ෂණ චේතනාව මත මුදලට ඇති ඉල්ලුම යනු කුමක් ද? පොළී අනුපාතිකය හා එකී මුදල් ඉල්ලුම අතර ඇති සම්බන්ධව රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(07) i. අ) පදනම් මුදල් (අධි බලැති මුදල්) සහ මුදල් සැපයුම අතර වෙනස දක්වන්න. (ලකුණු 03)

ආ) වාණිජ බැංකු වල මුදල මැවීමට අවශ්‍ය කරන කොන්දේසි කවරේද? (ලකුණු 03)

ii. තරගකාරී බැංකු පද්ධතියක් තුළ එක් බැංකුවක කිසියම් පුද්ගලයකු රුපියල් 2000 ක් තැන්පත් කළේ යැයි සිතන්න. සංචිත අනුපාතය 10% කි.

අ) මෙම බැංකුව අධි සංචිත සම්පූර්ණයෙන්ම ණය ලෙස සපයයි නම් මෙම බැංකුවේ අතරමැදි ශේෂ පත්‍රය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය) දක්වන්න. (ලකුණු 02)

ආ) ණය ලෙස නිකුත් වූ චෙක්පත් වෙනත් බැංකුවක් වෙතට ගලා ගියේ නම් මෙම බැංකුවේ ශේෂ පත්‍රය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය) දක්වන්න (ලකුණු 02)

ඉ) සෑම බැංකුවක්ම අධි සංචිත තත්ත්වයෙන් මිදීමට ණය ලෙස සපයයි නම් අවසානයේ බැංකු ශ්‍රමයේ (පද්ධතියේ) ශේෂ පත්‍රය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය) දක්වන්න. (ලකුණු 02)

iii. අ) මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම (ප්‍රති මිලදී ගැනීම්) පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ) මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට වඩාත් වැදගත් වන්නේ මතුපිට උද්ධමනයට වඩා යටිදූරි උද්ධමනයයි. (මූලික උද්ධමනය) පැහැදිලි කරන්න. (ලකුණු 03)

ඉ) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රධාන මූල්‍ය ආයතන කාණ්ඩ මහ බැංකු වාර්තාව අනුව වර්ග කර දක්වන්න. (ලකුණු 03)

(08) i. සම්පත් කාර්යක්ෂමව බෙදාහැරීම සඳහා රාජ්‍ය අංශය විසින් ඉටු කෙරෙන කාර්යයන් මොනවා ද? (ලකුණු 04)

ii. ඉදිකිරීම් ක්ෂේත්‍රයට යොදා ගැනීම සඳහා ගංගා වලින් වැලි ගොඩ දැමීම සමාජීය ප්‍රශස්ත නිමැවුම හා වෙළඳපොළ කාර්යක්ෂමව නිමැවුමට ඇතිකරන බලපෑම ප්‍රස්තාර සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. අ) ශ්‍රී ලංකාවේ බදු ව්‍යුහය තුළ ඇතුළත් ප්‍රධාන බදු වර්ග මොනවාද? (ලකුණු 02)

ආ) 2016-2017 කාල සීමාව අතර ශ්‍රී ලංකාවේ බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙනස්වී ඇත්තේ කෙසේ ද? (ලකුණු 02)

iv. ව්‍යවස්ථාපිත බදු ආපාතය සහ ආර්ථික බදු ආපාතය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 04)

v. ''කලාපයේ අනෙකුත් රටවල් සමග සංසන්දනය කරන විට ශ්‍රී ලංකාවේ බදු ආදායම පහළ මට්ටමක පවතී.'' ශ්‍රී ලංකාවේ බදු ආදායම අඩු මට්ටමක පැවතීමට බලපෑ හේතු කවරේද? (ලකුණු 04)

(09) i. රජයේ වර්තන වියදම් යනු කුමක් ද? ආර්ථික වර්ගීකරණය අනුව එහි ප්‍රධාන සංරචක කවරේද? (ලකුණු 04)

ii. අතුරු අයවැයක් හා අතුරු සම්මත ගිණුම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. රාජ්‍ය අයවැයක ස්වභාවය පරීක්ෂා කිරීමට සඳහා යොදා ගන්නා මිනුම් කවරේද? (ලකුණු 04)

iv. මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ අයවැය හිඟය මූල්‍යනය කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර කවරේද? (ලකුණු 04)

v. රාජ්‍ය හිමිකාරීත්වය යටතේ පැවති ව්‍යාපාර පෞද්ගලික අංශයට විකිණීම, බදුදීම, කළමණාකරණය පමණක් පැවරීම නිසා ඇතිවන හිතකර හා අහිතකර තත්ත්වයන් කවරේද? (ලකුණු 04)

(10) i. අන්තර් ජාතික වෙළඳාම තුළින් ආර්ථිකයක් අත්කර ගන්නා වාසි සඳහන් කරන්න. (ලකුණු 04)

ii. ජාත්‍යන්තර වෙළඳාමේ පදනම වශයෙන් සැලකෙන නිරපේක්ෂ වාසි මූලධර්ම සහ සාපේක්ෂ වාසි මූලධර්ම අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 02)

iii. සංයුක්ත සම්පත් ඒකකයක් භාවිතාකර චීනය සහ කොරියාව පරිගණක යන්ත්‍ර යන රූපවාහිනී යන්ත්‍ර නිෂ්පාදනය සිදු කරයි. එහි නිෂ්පාදන තත්ත්වයන් පහත වගුවෙන් පෙන්නුම් කරයි.

භාණ්ඩය	චීනය	කොරියාව
පරිගණක යන්ත්‍ර	12	8
රූපවාහිනී යන්ත්‍ර	6	2

අ) පරිගණක යන්ත්‍ර සහ රූපවාහිනී යන්ත්‍ර නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසි පවතින රටවල් හඳුනාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ) මෙම රටවල් එකිනෙක අතර වෙළඳාම සිදුකර ගනු ලැබුවහොත් වෙළඳාම සිදුවන්නේ කවර හුවමාරු අනුපාත යටතේ ද? (ලකුණු 02)

iv. අපනයන හා ආනයන ප්‍රවාහ සීමා කිරීමට හෝ මුලුමනින්ම නැවැත්වීමට භාවිතා කෙරෙන තීරුබදු නොවන සීමා කිරීම් කවරේද? (ලකුණු 04)

v. ගෙවුම් තුලන ලේඛණයේ ඉදිරිපත් වන ප්‍රධාන ගිණුම් නම් කරන්න. (ලකුණු 04)

vi. වෙළෙඳ අනුපාතිකය සහ විනිමය අනුපාතිකය යන සංකල්ප අතර වෙනස දක්වන්න. (ලකුණු 02)

The National e-learning Portal for The General Education